# ගෙවතු වවමු



ගොවිකම රජකමට නොදෙවෙනි යයි සිතනා
අයකුගෙ නිවහනක උද්‍යානකි සිත් ගන්නා
මිදුලෙහි කොතක මල් පඳුරෙහි රොන් ගන්නා
මී මැසි බමර කැල තරහෙට රඟ දෙන්නා

පවස නිවයි වැල් දෙඩමින් කසාවන්
දඹලවැලකි කරලින් බර මනාවන්
නිවසට අවැසි පලබර තුරු ලතාවන්
වැට රැකදෙන්නෙ ගෙවිලිය සතු වගාවන්

වම්බටු පතොල් මෑ කරවිල ගෙඩි ගෝවා
වැටකොළු තක්කාලි දිවගට රස කීවා
තම හිමි සමඟ කිරි කැටි සිත සැන සූවා
සුරවිමනක් ලෙසට ගොවි ගෙය දිස්වූවා

කංකුං නිවිති සාරණ ගොටු කොළ පඳුරු
සරුවට වැවී ඇත ලිඳ වට බැඳ පහුරු
කණකොට පොඩි පූනා මේවා මහ අහුරු
උගතුන් පඩිවරුන් වන්නේ වෙන කවුරු

සෙවනෙහි වැඩුන කිරි අල ගස් ටික සාරයි
තරහෙට ඉහළ නැගුමට අල වැල සූරයි
කොහිල විලේ දිය පිරිලා දලු මෝරයි
බිඟුකැල සමඟ මදනල වත්තම පීරයි

තිසරු පොළව ඇති තැන ඔවුනගෙ වත්තේ
කිකිළියො රැලට තනියට රත්තී ඇත්තේ
පොහොර ගොඩේ සරුබව වැඩි කළ යුත්තේ
ඔවුන් බවයි පෙරයිට ඇය දන ඇත්තේ

නිසිතැන් බලා ගොවිතැන් කටයුතු නිමවා
පලතුරු පලා අල බතලින් අඩු නැතුවා
දුක් කම් කටොලු ඇතිත් ඇතට පළවා
සිරිකත වඩිනු ඇත නිවසට උදේ හවා

හෙල දිවයිනේ මිණිකැට සැඟවුන පොළව
ගෙවිලියකගේ දිවිමග විය ඔප දමුව
ඔබ අප ජීවිතේ වන් සිරිලක් පොළව
පලබර තුරු හිසින් නිති සැරසුව මැනව

ලබුදූව, අක්මීමන,
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ
විෂය භාර නිලධාරී
එච්.එම්.බී. කුලරත්න විසිනි